# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1581/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 14/10 /2024<br>පැය 1445 |

## මාධ්‍ය නිවේදනය

**01. බොයිලේරුවක් පුපුරා යාමෙන් එහි සේවයකයෙකු මිය ගොස් තවත් සේවක පිරිසකට තුවාල - බඩල්ගම පොලිස් වසම**

2024.10.14 වන අද දින උදෑසන කාලයේ බඩල්ගම පොලිස් වසමේ මීගමුව පාර බඩල්ගම ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත ශාලාවක තුල වූ බොයිලේරුවක් පුපුරා යාමෙන් තුවාල ලැබූ සේවයකයින් 18 දෙනෙකු ප්‍රතිකාර සඳහා රෝහල් ගත කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ ගිරිඋල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙම කර්මාන්ත ශාලාවේ බොයිලේරුව ක්‍රියාත්මකව තිබියදී එය තුල ඇති වූ අධික පීඩනය හේතුවෙන් පිපිරීම සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේ දී අනාවරණය වී ඇත. තුවාලකරුවන් මීගමුව, දිවුලපිටිය හා අකරගම රෝහල්වල ප්‍රතිකාර ලබයි. බඩල්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් වසම**

2024.10.13 වන දින රාත්‍රී කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ දරමඩුවත්ත ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 600 ක්,** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු පෑලියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කන්තලේ පොලිස් වසම.

2024.10.14 වන අද දින උදෑසන කාලයේ කන්තලේ පොලිස් වසමේ වෙලින්ටන් හන්දිය ප්‍රදේශයේදී කන්තලේ ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ පෝටන්කාටු හන්දිය දෙස සිට ඕරලෝසු කණුව දෙසට ධාවනය කල යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ප්‍රථිකාර සඳහා කන්තලේ රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 69 ක් වූ පේරාරු, කන්තලේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. යතරුපැදිකරු තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබන අතර කන්තලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**